**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය - 2022**

**------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාල ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 ප්‍රකාරව 2022 වර්ෂය තුලදී කෙරීගෙන යන වැඩ සඳහා මුදලින් ගෙවීම රු 113,559,640 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් ලෙස දැක්විය යුතු වුවද එසේ සිදු කර නොතිබුණි. තවද, 2022 වර්ෂය තුලදී මුදලින් කරන ලද පාරිතෝෂික ගෙවීම් වටිනාකම රු.11,625,870 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යාමක් ලෙස දැක්විය යුතු වුවද රු.1,995,790 ක් අඩුවෙන් රු.9,630,080 ක් පමණක් මුදල් ගලා යාමක් ලෙස සටහන් කර තිබුණි. | කෙරීගෙන යන වැඩ සඳහා ගෙවීම් සිදුකල රු 11,982,547 මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් ලෙස වෙනම දැක්වීම හා එකඟ බවත් ඒ සඳහා මුදල් ලබාගත් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය අඩුකොට දැක්වීමටත් ඉදිරියේදී කටයුතු කරන බවත් දන්වමු. පාරිතෝෂික වටිනාකම 2023 ජනවාරි 03 වර්ෂයේදී විශ්‍රාම යන නිලධාරීන් සඳහා ගෙවිය යුතු පාරිතෝෂික වටිනාකම වන අතර එය සටහන් අංක 24 හි ගෙවිය යුතු වියදම්වල ඇතුලත්ව ඇත. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල විය යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12 ප්‍රකාරව බදු ගණනය කල යුතු වුවද 2022 අංක 45 දරන දේශීය ආදායම් බදු පනතේ ඡේද අංක 33(3) අනුව මුල් මාස 06 සඳහා සියයට 24 හා දෙවන මාස 06 සඳහා සියයට 30 බදු අනුපාතය ලෙස සලකා බදු ගණනය කලයුතු බව දක්වා තිබුනද, මුළු කාලච්ඡේදය සඳහාම බදු අනුපාතය සියයට 24 යොදාගෙන ආදායම බදු ගණනය කිරීම හේතුවෙන් බදු වියදම රු.11,833,776 කින් | අධිකාරියේ ආදායම් බදු ගෙවන තක්සේරු වර්ෂය 2022 ජනවාරි 01 දිනෙන් පටන් ගැනීම නිසා මුළු වර්ෂයටම 24% ක අනුපාතය මත බදු ගණනය සිදුකර ඇත. 2022 අංක 45 දරණ දේශිය අදායම් බදු පනතේ 33 (3) (ii) (ඇ) අනුව ඉදිරියේදී නිර්දේශිත බදු ගෙවීම් සිදුකර ඌණ බදු වෙන්කිරීම ගිණුම්වල ගැලපීමට | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඌන ගණනය වී තිබුණි.තවද, ඉහත පරිදි වෙනස් බදු අනුපාතයන් යොදා ගැනීම හේතුවෙන් විලම්භිත බදු වගකීම රු.6,649,335ක් අඩුවෙන් ගණනය කර තිබුණි. | කටයුතු කරනු ලැබේ. | |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 හි ඡේද 120 අනුව පාරිතෝෂික සම්බන්ධ සියලුම සේවා වියදම් ආකෘතිය අනුව විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙහි වාර්තා කළ යුතු වුවද පාරිතෝෂික වෙන්කිරීම් ගණනය කිරීමේදී වර්ෂයට අදාළ පාරිතෝෂික වියදම් වටිනාකම වූ රු. 1,930,028 ක් හා පොලී වියදම වූ රු. 5,444,646 ක් ඇතුලුව මුළු එකතුව රු. 7,374,674 ක් වියදම ලෙස හා ආයුගණන ලාභය රු.7,361,043 ක් වෙනත් විස්තීරණ ආදායම් ලෙස සටහන් නොකර ශුද්ධ ප්‍රතිඵලය රු. 13,631 ක පාරිතෝෂිත වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ රු. 7,374,674 ක මුළු පාරිතෝෂික වියදම් පිලිබඳ තොරතුරු 2022 ගිණුම් ප්‍රකාශනයේ සටහන් අංක 22 යටතේ විස්තර සහිතව දක්වා ඇත.<br>රු. 7,361,043 ක් වූ ආයු ගණන ලාභය විගණනයේ දක්වා ඇති පරිදි විස්තීරණ අදායම් ප්‍රකාශය යටතේ පෙන්වීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.<br>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 හි 57 වැනි වගන්තියට අනුව Defined Benefit Plan Method යටතේ කාලපරිච්ඡේදයේ රු 13,631 ක පාරිතෝෂික වියදම අදායම් ප්‍රකාශයේ දක්වා ඇත. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල විය යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 37හි 10 ඡේදය ප්‍රකාරව අතීත ක්‍රියාවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවිය හැකි බැඳීමක් (Possible Obligation) සම්බන්ධයෙන් ගෙවීමට අපේක්ෂිත මුදල අසම්භාව්‍ය බැරකමක් ලෙස ගිණුම්කරණ සටහන් යටතේ දැක්විය යුතු වුවද, එම තත්ත්වය ගිණුම් සටහන් මගින් හෙලිදරවු නොකර වන්දි වශයෙන් ගෙවීමට සිදුවේයැයි අපේක්ෂිත මුදල රු.7,700,000ක් පමණක් ගිණුම් ගත කර තිබුණි. | මෙම නඩු සඳහා ගෙවීමට ඉදිරියේදී සම්භාවිතාවක් ඇතිවේ යන අපේක්ෂාවෙන් මෙම රු. 7,700,000 වෙන්කිරීම සිදුකොට ඇත. ඉදිරියේදී නිශ්චිත කාරණා සම්බන්ධයෙන් පමණක් වෙන්කිරීම හා විගණනයේ පෙන්වාදී ඇති පරිදි ලාභයෙන් කපා හැරීම සිදුකරනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල විය යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව වත්කම්වලට අදාල හානිකරණ අලාභ හදුනාගැනීමේදී එම වත්කම් සමාලෝචනය කර ඊට අදාලව වෙන් කල යුතු හානිකරණ අලාභ වටිනාකම වාර්ෂිකව ඇස්තමේන්තු කල යුතු වුවත් එසේ සිදු නොකර අනෙකුත් වත්කම්, ලැබිය යුතු දැ හා තැන්පතු සහ අත්තිකාරම් සඳහා පිළිවෙලින් රු.200,000, රු.1,407,972 හා රු.1,433,947 ක් ලෙස වූ එකම වටිනාකම වසර පහකට අධික කාලයක සිට හානිකරණ අලාභ ලෙස ගිණුම්වලට ගැළපීම් කර තිබුණි. | හානිකරණ අලාභ සම්බන්ධයෙන් විගණනයේ පෙන්වා දී ඇති හානිකරණ අලාභවලට අදාළ වර්තමාන තත්වය පරීක්ෂා කර බලා අවශ්‍ය ගැලපීම් ඉදිරියේදී සිදුකරනු ලැබේ. | ගිණුම් ප්‍රතිපත්ති වලට අනුව ක්‍රියාකල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සුළු හා මධ්‍ය පරිමාණ මැණික් හා ස්වර්ණාභරණ ව්‍යාපාරිකයන් නගා සිටුවීම සඳහා අධිකාරිය විසින් ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ මහල් 02 ක් කුලියට ගෙන එහි කඩ කාමර පවත්වාගෙන යාමට ව්‍යාපාරිකයන් 19 දෙනෙකුට කුලියට ලබාදී තිබුණි. ඉන් කඩ හිමියන් 03 දෙනකුගෙන් 2019 දක්වා ලැබිය යුතු රු.2,989,815 ක මුදල මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | මෙහි දක්වා ඇති කඩහිමියන්ගෙන් හිඟ මුදල් අයකර ගැනීමට මේ වනවිට නඩු පවරා ඇති අතර නීති අංශයේ දැන්වීමට අනුව අයකර ගත හැකි මුදල, කාලය පිලිබඳව නිශ්චිතව විශ්වාසදායකව පූර්ව නිගමනයකට එළඹිය නොහැකි බව දන්වා ඇත. කෙසේ වුවද ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ කඩ කාමර කුලියට දීමෙන් වන සියළුම කඩහිමියන්ගෙන් (නීති ක්‍රියාමාර්ග ගෙන ඇති කඩහිමියන් ඇතුළුව) අයවිය යුතු මුදල් සඳහා වෙන්කිරීම 2023 ගිණුම් වර්ෂයෙන් සිදුකිරීමට කටයුතු සිදුකරනු ලැබේ. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | අධිකාරිය සතු විදේශ මුදල් මඟින් ගනුදෙනු වන තැන්පතු 03 ක 2022 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂය වූ ඇ.ඩො . 77,378.05 ක වටිනාකම එදිනට පැවති හුවමාරු වටිනාකමට (රු.362) අගය නොකිරීම හේතුවෙන් රු. 11,650,248 කින් මුදල් හා මුදල් සමාන දැ හි වටිනාකම අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ගනුදෙනුව සිදුවූ දින පැවති විනිමය අනුපාත අනුව සටහන් කොට ඇත.වර්ෂ අවසාන විනිමය අනුපාතය අනුව අවසාන ශේෂය ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

| | අදාල ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට වූ කොන්ත්‍රාත් රඳවා ගැනීම් ශේෂය රු.22,611,038 ක් වූ අතර එම ශේෂය තුල 2009 ජනවාරි 01 දිනට පෙර සිට පැවත එන රු.2,568,873 ක වටිනාකමක් ඇතුළත්ව තිබුණද, එම වටිනාකමට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2009ට පෙර වර්ෂවල ගිණුම් තොරතුරු පරීක්ෂා කර බලා රු. 2,568,873ක් වූ හඳුනා නොගත් 10%ක රඳවා ගැනීම් ශේෂය සම්බන්ධ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | විධිමත්ව ලේඛණ නඩත්තු කල යුතුය. |
| (ආ) | වතු සමාගමක් වෙනුවෙන් ගෙවිය යුතු රු.22,306,195 ක මුදල සඳහා අධිකාරිය විසින් රු.22,090,642 ක් උසාවියෙහි තැන්පත් කර ඇති අතර එම මුදල් පිළිවෙලින් විවිධ ණයහිමියන් යටතේ සහ විවිධ තැන්පතු යටතේ ගිණුම් ගත කර ඇති නමුත් ඒ සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | වතු සමාගමක් වෙනුවෙන් ගෙවිය යුතු මුදල සඳහා උසාවියේ තැන්පත් කර තිබෙන රු22,306,195. ක මුදලට අදාළ තොරතුරු ඉදිරියේදී විගණන අංශයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | -එම - |
| (ඇ) | බාහිර පාර්ශවයන් විසින් ඉඩම් ආරවුල් විසඳා ගන්නා තෙක් අධිකාරියේ තැන්පත් කර ඇති රු.116,136,877 ක මුදල් ලද තැන්පතු හා අත්තිකාරම් යටතේ ගිණුම් ගත කර ඇති නමුත් ඒ සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | ඉඩම් නිරවුල් සම්බන්ධ අදාළ ලෙජර් ගිණුම වන 211613 තුල තොරතුරු ඇතුලත් කර ඇත .<br>මීට අදාළ ලැබීම් හා ගෙවීම් ලේඛන සෑම ප්‍රාදේශීය කාර්යාලයක් විසින්ම පවත්වාගෙන යනු ලබයි. | -එම- |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ සුළු හා මධ්‍ය පරිමාණ මැණික් හා ස්වර්ණාභරණ ව්‍යාපාරිකයන්ට කඩ කාමර ලබාදීම සඳහා අධිකාරිය සහ ලෝක වෙළඳ මධ්‍යස්ථාන සමාගම අතර ඇති කර ගෙන තිබූ බදු කුලී ගිවිසුම 2021 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් කර තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් 2004 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුල ලබාදී තිබූ ආරක්ෂිත ඇප තැන්පතු රු.16,368,300 ක් විගණිත දිනය වන 2023 පෙබරවාරි 28 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයේ පිහිටා තිබූ ශ්‍රී ලංකා මැණික් සහ ස්වර්ණාභරණ හුවමාරු මධ්‍යස්ථානය සඳහා Overseas Reality PLC සමාගම සමඟ ඇතිකර ගෙන තිබූ කුළී ගිවිසුම 2021 ඔක්තොම්බර් 31 දිනෙන් අවසන් කරන ලදි. එසේ වුවද රු .16, 368,300/- ක ආරක්ෂිත ඇප තැන්පතු නිදහස් කර ගැනීමට නම් සියළු සාප්පු නිරවුල් බුක්තියෙන් මෙම ආයතනය වෙත ලබා දිය යුතුව තිබිණි. | ආරක්ෂිත ඇප තැන්පතුව කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | එහෙත් සාප්පු අංක 30, 36 සහ 47 යන කඩාසාප්පු අදාළ සාප්පු හිමියන් විසින් අධිකාරිය වෙත 2021 ඔක්තොම්බර් 31 වන දින වන විටත් භාර දී නොතිබිණි. මේ අතරින් සාප්පු අංක 36 සඳහා මේ වන විට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර අධිකරණය විසින් සාප්පුව භාරදෙන ලෙසටත් හිඟමුදල් ගෙවන ලෙසටත් නියෝගකර ඇතත් සාප්පු හිමිකරු විසින් අධිකරණ නියෝගය අනුව මෙතෙක් ක්‍රියාකර නොමැත. | |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීය අදායම් දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක SEC/2020/04 හි අනු අංක (C)2 පරිදි, යම් මාසයක එකතුකරන ලද රදවාගැනීමේ බදු ඊළඟ මස 15 දිනට පෙර දේශීය අදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේශනය කල යුතු වුවද, 2022 නොවැම්බර් 30 දක්වා අධිකාරිය මැණික් හා ස්වර්ණාභරණ වෙන්දේසි කිරීමේදී අදාල වෙන්දේසි මුදලින් අයකරන ලද සියයට 2.5 ක රදවාගැනීමේ බදු රු.483,813,173 ක් 2022 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රේශණය කර නොතිබුණි. | 2.5 % රදවාගැනීමේ බදු සඳහා ගෙවීම් සිදුකලද ඊට අදාල ලියවිලි සම්පූර්ණ කොට ලබාදීමට කාලපරිච්ඡේදයක් ගතවන හෙයින් ගෙවීම් සඳහා ප්‍රමාදයක් පවතී. අධිකාරිය විසින් 2022 වර්ෂයේ මේ සඳහා රුපියල් මිලියන 128.29 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කොට ඇත. ඉදිරියේදී කඩිනමින් නිරවුල් කිරීමට පියවර ගනු ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 486 | චෙක්පත් අගරු වු විටකදී ඒ සඳහා වන වටිනාකම හැකි ඉක්මනින් මුදලින් අයකරවා ගත යුතු වුවත් වර්ෂ 09 ක් ඉක්මවු අගරු චෙක්පත් 02 ක වටිනාකම වු රු.178,840 සඳහා මුදල් අයකරගෙන නොතිබුණි. | වර්ෂ 09 ක් පැරණි වන අතර නීතිමය පියවර ගැනීමට හැකියාවක් නොමැත. රු 178,840/- ක් සඳහා වූ අගරු වූ චෙක්පත් වලින් රු 28,840 ක් 2010 වර්ෂයේ පැවති ජුවෙල්ස් ප්‍රදර්ශනය සඳහා වෙළඳ කුටියක් සඳහා ලැබුණු | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අත්තිකාරම් මුදලක් වන අතර එම චෙක්පත අගරුවී තිබීම හේතුවෙන් එම වෙළඳසැල ලබාදීම සිදුකර නොමැත. අනික් රු 150,000/- චෙක්පත වැටලීමක් සම්බන්ධයෙන් ලබාගත් සමථ මුදල වන අතර එම චෙක්පත ලබාගත් නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගෙන ඇත. | |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන රු. 26,890,229ක් ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර තිබුණි. | මහා භාණ්ඩාගාරයෙන් මේ සඳහා අනුමැතිය ලැබී ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ඇ) | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ | ඉදි කිරීම් වැඩ කොන්ත්‍රාත් පමණක් සමෘද්ධි ප්‍රජා මුල සංවිධාන/සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන වෙත පැවරිය හැකි නමුත්, මැණික් ව්‍යාපෘති සිදු කිරීමට එම සමිති වෙත බලය පවරා නොතිබුණි. නමුත්, අධිකාරිය විසින් මැණික් ව්‍යාපෘති 4 ක කටයුතු සිදුකිරීමට සමෘද්ධි ප්‍රජා මුල සංවිධාන සමඟ ගිවිසුම්වලට එළඹ එම කටයුතු සිදුකිරීමට බලය පවරා තිබුණි. | අදාල වසම් දෙකෙහි අඩු ආදායම්ලාභීන් වන සියළු සමෘද්ධිලාභීන් නියෝජනය වන නිල සමිති වන්නේ සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයයි. ඒ අනුව පෙර ක්‍රියාත්මක කරන ලද අඩු ආදායම්ලාභී ව්‍යාපෘති වල පරිදිම මෙම ව්‍යාපෘතියේදී ද අදාල ප්‍රාදේශීය ලේකම්වරු වෙතින් තහවුරු කරගනු ලැබූ ගඟ දෙපස වසම් දෙකෙහි නිල සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන 07 මෙහිදී බලපත්‍ර පාර්ශ්වය ලෙස කටයුතු කෙරේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ඈ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මුදල් වර්ෂය අවසන් වීමෙන් පසුව දින 60 ක් ඇතුලත වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් සමඟ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතු වුවත් ආයතනය විසින් වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමඟ ඉදිරිපත්කර නොතිබුණි. | 2022 වාර්ෂික වාර්තාවේ සිංහල හා ඉංග්‍රීසි පිටපත් සූදානම් කර ඇති අතර දෙමළ පරිවර්තනය සඳහා යොමු කොට ඇත. ඉදිරියේදී විගණනය සඳහා ලබාදෙනු ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත | | | |
| (i) 14 (ග) වගන්තිය | මැණික් කර්මාන්තයේ හා ස්වර්ණාභරණ කර්මාන්තයේ වැඩ කරන තැනැත්තන්ගේ සේවා නියුක්ති නියමයන් හා කොන්දේසි, විශේෂයෙන් එම තැනැත්තන්ගේ ජීවිත හා ශරීරාංග අනතුරුවලින් ආරක්ෂා කිරීම සඳහා ගතයුතු ආරක්ෂක පියවර විධිමත් කිරීම හා පාලනය කිරීමේ අරමුණින් මැණික් ගැරීමේ බලපත්‍ර නිකුත් කිරීමේදී අය කරනු ලබන මුදලින් රු.500 ක් මැණික් ගැරීමේ සුභසාධක අරමුදලට බැර කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට මෙම අරමුදලේ ශේෂය රු.34,807,024 ක් වූ අතර මෙම අරමුදල මගින් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි. | අධිකාරියේ මූලික අරමුණු පතල් අනතුරු අවම කර ගැනීම වන අතර ඒ සඳහා සුරක්ෂිතතා අත්පොතක් හඳුන්වාදීම සහ පතල් කරුවන්ව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවත්වීම සිදුකර ඇති අතර පතල් අනතුරු අවම කිරීමට පියවර ගෙන ඇත. එසේම මෙම අරමුදල ඌන උපයෝජනය වීම වළක්වාගැනීම සඳහා 2020 වර්ෂය තුලදී පතල් අනතුරු සම්බන්ධයෙන් ලබාදී ඇති ප්‍රතිලාභ සැලකිය යුතු මට්ටමකින් ඉහල නැංවීමට කටයුතු කර ඇත. වර්ෂ 03 හිදී ප්‍රතිලාභ ලබාදීම් පහත පරිදු සිදු කර ඇත.<br>වර්ෂය - ලබාදුන් ප්‍රතිලාභය<br>2020 - 1,090,000<br>2021 - 770,000<br>2022 - 1,340,000 | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ii) 15(1)වගන්තිය | වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාව තුල මැණික් කර්මාන්තය කරගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව වගකිව යුතු එකම බලධාරියා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වන නිසා මැණික් කර්මාන්ත විෂයට අදාළ ප්‍රධාන නියාමන අධිකාරිය තුන්වන පාර්ශවය සමඟ සෘජුවම මැණික් ගැරීමේ ව්‍යාපෘතිවල නියැලීම පනතට පටහැනි බවට නීතිපති දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී තිබුණත් සමාලෝචිත වර්ෂය තුල | 2019.06.04 දින අංක E/17/19/NG&JA ලිපිය මගින් නීතිපති දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති නිර්දේශ ප්‍රකාරව අධිකාරිය සෘජුව මැණික් ගැරීමේ ව්‍යාපෘති වල නියැලී නොමැති අතර දෙවන පාර්ශවය වෙත මැණික් ගැරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර ඇත. එහිදී අධිකාරිය විසින් දෙවන සහ තෙවන පාර්ශවයන් සමග ගිවිසුම් ගතවී ඇත්තේ අදාල ව්‍යාපෘතිය නිසිපරිදි අධීක්ෂණය කිරීම හා එම ව්‍යාපෘතිය තුලින් හමුවන මැණික් අධිකාරිය බාරයට ගැනීමටත් එම මැණික් | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | මැණික් ගැරීම් ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කර තිබුණි. | අලෙවි කිරීමෙන් ලැබෙන අදායමින් රාජ්‍ය බාගය රඳවා ගෙන ඉතිරි මුදල සම්බන්ධිත බලපත්‍රලාභී පාර්ශවය වෙත නිදහස් කිරීම සම්බන්ධයෙන් වන බව පෙන්වා දෙමි. | |
| (iii) 15(2) වගන්තිය | මැණික් පරීක්ෂා කිරීම හා සහතික නිකුත් කිරීම සඳහා පවත්වාගෙන යන පෞද්ගලික රසායනාගාර ලියාපදිංචි කිරීමට හා නියාමනය කිරීමට ක්‍රමවේද සකස් කර නොතිබුණි. | මැණික් රසායනාගාර ලියාපදිංචි කිරීමට අදාල ගැසට් කෙටුම්පත සකස් කර නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකර නීතිගත කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා 2022.12.13 දිනැතිව විෂයභාර අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (iv)17(1) වගන්තිය | කිසිම තැනැත්තකු විසින් කිසිම ස්ථානයක ස්වර්ණාභරණ කර්මාන්තය කරගෙන යාමේදී ඒ කර්මාන්තය කරගෙන යන ස්ථානය අධිකාරියේ ලියාපදිංචි විය යුතු වුවද, කර්මාන්ත කර ගෙන යන පුද්ගලයන් ලියාපදිංචි වී ඇත්ද යන්න පිළිබඳව නිසි නියාමනයක් සිදු කර නොතිබුණි. | අංක 1436/21 – 2006.03.17 දින නිකුත් කරන ලද අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව රන් ප්‍රමාණ නිශ්චය කිරීම සහ මුද්‍රා තැබීමේ අංශය සමඟ එකාබද්ධව උතුරු පළාත, උතුරු මැද පළාත, නැගෙහිර පලාත, දකුණු පලාත, මධ්‍යම පලාත හා බස්නාහිර පලාතේ තෝරාගත් නගර කේන්ද්‍ර කරගෙන ස්වර්ණාභරණ වෙළඳසැල් 400ක් පමණ 2022 වර්ෂයේදී අනුග්‍රාහකයාගේ සළකුණ මුද්‍රා තැබීම පිළිබඳ දැනුවත් කිරීම සිදු කර ඇත. | වාර්ෂිකව ලියාපදිංචි කිරීම පිළිබඳව නියෝග සකස් කර නිසි නියාමනයක් සිදුකල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.328,232,606 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු.204,049,942 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.124,182,664 ක වර්ධනයක් නිරීක්ෂණය විය. කාලච්ඡේදය තුලදී පරිපාලන වියදම්, පුද්ගල පඩිනඩි හා අදායම් බදු වියදම රු.174,110,491 කින් වැඩි වී තිබූ නමුත්, මැණික් ඉඩම් වෙන්දේසි හා ස්වර්ණාභරණ අපනයන සේවා ගාස්තු, නියෝජිත බලපත්‍ර ගාස්තු හා පොලී අදායම් රු.243,601,094 කින් වැඩි වී තිබීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ පනත 1993 වර්ෂයේ අනුමත කර ගැනීමෙන් පසුව එය කාලානුරූපීව සංශෝධනය කර ගැනීමට සමාලෝචිත වර්ෂයේද පියවර ගෙන නොතිබුණි. | උක්ත කරුණට අදාලව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල සංදේශය සහ අනෙකුත් අදාල ඇමුණුම් ද සහිතව සංශෝධිත 1993 අංක 50 දරණ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ පනත් කෙටුම්පත දෘඪ හා මෘදු පිටපත් වශයෙන් 2023.04.12 දිනැතිව විෂයභාර අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | කාලානුරූපීව පනත සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) කිලෝ ග්‍රෑම් 510ක් බර " Rough Sapphire Cluster" මැණික් පාෂාණය 2021 ඔක්තෝබර් 27 දින අයිතිකරු විසින් පිළියෙල කරන ලද ඉන්වොයිසියට අනුව ඇ.එ. ජනපද ඩොලර් 10,000,000 කට එනම් රු. 2,030,600,997 කට තක්සේරු කර තිබුණි. එය අධිකාරියේ අධ්‍යක්ෂ (තක්සේරු / රත්න විද්‍යාඥයකු විසින් මිලෙහි සාධාරණත්වයක් සහතික කර තිබූ අතර පාෂාණ තක්සේරුකර සහතික පත්‍රයක් ලබා ගැනීම සඳහා ස්විට්සර්ලන්තයේ ගැබ්ලින් රසායනාගාරය වෙත යවා තිබූ එම මැණික් පාෂාණය දින 443 කට පසුව මෙරටට ගෙන ඒමේදී 2020 මාර්තු 02 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ 13.6 ඡේදය ප්‍රකාරව අයකරගත යුතු ඉන්වොයිසියේ සම්පූර්ණ නැව්ගත වටිනාකමින් සියයට 1ක් වූ ඇ.එ.ජ. ඩොලර් 10,000,000 * 1% = 100,000 කට සමාන රු. 37,100,000 ක් (2023 ජනවාරි 13 දිනට ඇ.එ.ජ. ඩොලර් 1 = රු.371) බලපත්‍ර ලාභියාගෙන් අයකර ගෙන නොතිබුණි. | 510kg බර "Rough Sapphire Cluster" මැණික් පාෂාණය 2021/10/27 දින US $ 10,000,000/= කට (මිලියන 10 කට) එහි වටිනාකම තක්සේරු කර ස්විස්ටලන්තයේ ගුබිලින් රසායනාගාරයේ පරීක්ෂණයක් සඳහා සහ වාර්තාවක් ලබාගැනීම සඳහා යවා තිබුණි. මෙම පාෂාණය නැවත 2023/01/13 දින නැවත ලංකාවට රැගෙනවිත් ඇත.<br>• මෙම මැණික් පාෂාණය ප්‍රදර්ශණාත්මක, කෞතුකාගාර වටිනාකමක් ඇති අයිතමයක් වේ.<br>• මෙම පාෂාණය විදේශ සහතිකයක් ලබාගැනීම සඳහා යවා ඇති අතර එහිදී නාමික වටිනාකමක් සටහන්කර ඇත්තේ රක්ෂණ ආවරණය සඳහා බව එහි හිමිකරු වාර්තාකර ඇත.<br>• මෙම මැණික් පාෂාණය සහතික පත්‍රයක් ලබා ගැනීම සඳහා යොමුකර නියමිත කාලය තුල නැවත ගෙනවිත් නොතිබුණද එම ගල විකිණීමට කටයුතු කර නොතිබූ බැවින් නොවිකුණූ අයිතමයක් මත රුපියල් මිලියන 30 ක පමණ සේවා ගාස්තුවක් | මැණික් ගල් තක්සේරු කිරීමේදී විධිමත් ක්‍රමවේදයක් සකස් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අයකිරීම තුල එකී ව්‍යාපාරික ආයතනය බිද වැටෙන බැවින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 2300 යටතේ 2023.04.08 දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු වාර්තාකර ගෙවිය යුතු ගාස්තු අය නොකිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. | |
| (ආ) | මැණික් බලපත්‍ර නිකුත් කිරීමේදී භාරනු ලබන මැණික් පතල් නැවත පුරවා ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් සාමාන්‍ය පතලක රු.4,500 සිට රු.9,000 ක වටිනාකමක් සහ යාන්ත්‍රික පතල් සඳහා වර්ග අඩි 3,000 සිට 40,000 ක් දක්වා ප්‍රමාණයක් සඳහා රු.600,000 සිට රු.5,000,000 ක් ලෙස විශේෂ ආරක්ෂණ ඇපයක් පතල්කරුවන්ගෙන් අයකරන අතර එම පතල් නැවත ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසුව එම ඇප තැන්පතු නැවත ඔවුන් වෙත ලබාදිම සිදුකරයි. මේ ආකාරයට එකතුවූ රු.993,253,918 ක මුදලක් පතල් කැණීම්කරුවන් විසින් නැවත ලබා ගැනීමකින් තොරව තිබූ අතර, එම හේතුවෙන් මෙම මැණික් පතල් වලවල් වසා අදාල භූමි නිසි ලෙස ප්‍රතිසංස්කරණය වීමත් සිදුවී තිබේද යන්න පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | අධිකාරිය විසින් බලපත්‍ර ලබාදෙන මැණික් බලපත්‍ර කොන්දේසි වලට අනුව පතල් බලපත්‍රය අවසන්වී මාස 02 ක කාලය තුල අදාල පතල් වල වසා ඇප මුදල් ඉල්ලුම් කිරීම සිදුකරනු ලබන අතර එසේ නොවන විටදී අදාල ඇපමුදල් රාජසන්තක කිරීම කරනු ලබන බැවින් අධිකාරියේ අදායමට එකතුවේ. සමාලෝචිත වර්ෂය තුල රාජසන්තක කරන ලද රු. මිලයන 8,980,350 වන ඇප මුදලින් වැඩි ප්‍රමාණයක් සාම්ප්‍රධායික පතල් සම්බන්ධයෙන් තබන ලද රු 4500/- ක ඇපය වන අතර බොහෝ අවස්ථාවලදී බලපත්‍රධාරීන් විසින් අදාල පතල වසා භූමිය සකස් කර තිබුණද මෙම ඇප මුදල ඉල්ලුම් නොකිරීම හේතුවෙන් මෙලෙස රාජසන්තක වීම සිදුවේ. විගණනය විසින් දක්වා ඇති රුපියල් මිලියන 993 ශේෂය තුල 90% ක් පමණ ක්‍රියාත්මක යාන්ත්‍රික පතල් සඳහා පවතින ඇප තැන්පතු වන අතර යාන්ත්‍රික පතල් සම්බන්ධයෙන් විශේෂ ආරක්ෂක ඇප මුදලක් පවතින බැවින් බොහෝ අවස්ථා වල පතල් කටයුතු අවසානයේදී අදාල පතල වසා භූමිය සකස් කර ඇප මුදල් නිදහස් කර ගැනීම සිදුවේ. | මැණික් පතල් වලවල් වසා අදාල භූමි නිසි ලෙස ප්‍රතිසංස්කරණය කල යුතුය. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රත්නපුර මැණික් කෞතුකාගාරය ඉදිකිරීම සහ නාලන්දා උද්‍යානය සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 45 ක ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුලත් කර ඇති අතර, සමාලෝචිත වර්ෂය තුළ රු.250,000 ක් ගෙවා තත්ත්ව | ශ්‍රී ලංකාව තුල මැණික් සම්බන්ධ කෞතුකාගාරයක් නොමැති බැවින්, මැණික් බහුලව හමුවන ප්‍රදේශයක් ලෙස රත්නපුර නගරය මූලික කර ගනිමින්, දෙමුවාවත ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ | නිෂ්කාර්ය වියදම් ඇති නොවීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සහතික වාර්තාවක් පමණක් සකස් කර තිබුණද, ඉදිරි වැඩකටයුතු නතර කර තිබූ බැවින් එම වැය කල මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | මධස්ථානය ඉදිකිරීමට සමගාමීව මෙම කෞතුකාගාරය ඉදිකිරීමට තීරණය විය. ඒ අනුව එහි මූලික සංකල්ප පත්‍රිකාව කොළඹ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් සකසන ලදි. තවද මෙම කෞතුකාගාරය ඉදිකිරීමට වෙන්කර තිබූ ගොඩනැගිල්ල වසර 100කට වඩා පැරණි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් පැරණි ගොඩනැගිල්ලක් වූ බැවින් CECB ආයතනයෙන් රු. 250,000 ක් වැය කර තත්ව සහතික වාර්තාවක් ලබා ගෙන ඇත. මුදල් අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 ප්‍රකාරව කටයුතු කිරීම හේතුවෙන් 2023 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මෙන් එය ඉවත් කරන ලදි. | |
| (ආ) | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ආරම්භ කරන ලද මැණික් ත්‍යාග අරමුදල සඳහා අනවසර මැණික් ගැරීම් වලදි අධිකාරිය පනවන දඩ මුදල් සහ රාජසන්තක කරන භාණ්ඩ සහ ඉල්ලම් වෙන්දේසි කිරීමේදි ලැබෙන මුදල් සහ අධිකරණය විසින් නියම කරන දඩ මුදල් බැර කරනු ලබන අතර අධිකරණය විසින් පනවන ලද දඩ මුදල් හැර අනිකුත් එකතු කරන දඩ මුදල් වලින් සියයට 35 ක් වැටලීම් කරන කණ්ඩායමට හා සියයට 5 ක් වැටලීම් කරන කාර්යාලයට හා සියයට 10 අධිකාරියේ සියලුම සේවකයන්ට ලබාදි ඉතිරි සියයට 50 අධිකාරියේ ආදායමට බැර කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට මෙම අරමුදලේ ශේෂය රු.45,226,589 ක් විය. | ත්‍යාග අරමුදල් ගිණුම පිළිබඳව වාර්ෂිකව භාණ්ඩාගාරය වෙත තොරතුරු ඉදිරිපත් කරනු ලබයි. අධිකරණය විසින් පනවන ලද දඩ මුදල්වලින් හිමිකම් ඉදිරිපත් නොකල දඩ මුදල්වලට අදාළ ශේෂය මෙම අරමුදල තුල ඉදිරියට ගෙන යනු ලැබේ. | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට සහ අරමුදල ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් රු.මිලියන.19ක පිරිවැයකට අධිකාරියේ භාවිතය සඳහා මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමට 2016 වර්ෂයේදී මෘදුකාංග සැපයුම් ආයතනය සමග ගිවිසුම් ගත වී ඇති අතර ඒ සඳහා රු.10,621,000 ක් ගෙවා තිබුණි. | මෙම ව්‍යාපෘතියට අදාල කාර්ය පිරිවිතරයට අනුකූලව නියමිත කාලය තුල නිම කිරීමට අදාල ආයතනය අපොහොසත් වීම හේතුවෙන් කාලය දීර්ඝ කිරීමට සිදුවී ඇත. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ 2022 ජුනි 30 සහ ඉන් අනතුරුව 2022 සැප්තැම්බර් 30 දක්වා සේවා ගිවිසුම දීර්ඝ කිරීමට කටයුතු කර ඇත. මේ වනවිට අදාල | ප්‍රසම්පාදන කාර්ය පරිපාටිය අනුගමනය කළ යුතුය. |

| | |
|---|---|
| මෙහි ප්‍රසම්පාදන කටයුතු ආරම්භකර වසර 06 කට අධික කාලයක් ගත වී ඇති නමුත් නිමකර නොතිබුණි. | ආයතනය සමග සාකච්ඡාකර මෙම ව්‍යාපෘතිය අවසන් කරන දිනය නිශ්චිතව දැක්වීමත් ගිවිසුම සංශෝධනය කර ගැනීම සහ ව්‍යාපෘති කාලය නැවත නැවත දීර්ඝ නොකර අවසන් එකඟතාවයකට පැමිණීමට නියමිතය. |